## ශ්‍රී ලංකා
## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## පාර්ලිමේන්තුව

---

# 1987 අංක 46 දරන
# ශ්‍රී ලංකා වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 නොවැම්බර් මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 දෙසැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1987 අංක 46 දරන ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1987 නොවැම්බර් මස 30 වන දින]

එල්.ඩී.—ඕ. 52/85

## ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය" යනුවෙන් හැඳින්වුණු සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති වලට අනුකූලව, එකී සංගමයට සම්බන්ධ සියලුම පරමාර්ථ සහ කරුණු එලඳයී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණු හෙයින් ද: පූර්විකාව.

සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ කරගෙන ගොස් ඇති හෙයින් සහ එය සංස්ථා ගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1987 අංක 46 දරන ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලා වේදීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන් වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමයේ දැනට සාමාජිකයන් වන සියලු තැනැත්තෝ ද මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයෝ ද "ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනු වෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන්නාහ. තවද, එකී නාමය යටතේ සියලු අධිකරණවල එය විසින් නඩු පැවරීම සහ එයට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ හැකි වන අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ හා ස්වකීය අභිමතය පරිදි ඒ මුද්‍රාව වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය සංස්ථාව සතු වන්නේ ය. ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය සංස්ථාගත කිරීම.

3. (1) කොටස් අනුප්‍රමාණ පදනමක් මත පාරිශ්‍රමික ලබන පත්‍ර වාර්තාකරුවන්, ස්වාධීන ලේඛකයන් සහ පත්‍ර කලාවේදීන් නොවන්නා වූ ද පත්‍ර කලාව ප්‍රධාන වෘත්තීය කරගෙන ඇත්තා වූ ද සියළු තැනැත්තෝ සංස්ථාවේ සාමාජිකයන් වීමට සුදුසු වෙති. සාමාජිකත්වය සඳහා සුදුසුකම්.

(2) සාමාජිකත්වයේ නියමයන් හා කොන්දේසි ද සාමාජිකයන් වශයෙන් බඳවා ගැනීම හා ලේඛනගත කිරීම ද සංස්ථාවේ රීති අනුව තිරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

4. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) රටේ පත්‍ර කලා වැඩ කටයුතු නංවාලීම, පෝෂණය කිරීම හා ආරක්ෂා කිරීම ;

(ආ) අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආරක්ෂා කිරීම ;

(ඇ) පත්‍ර කලා ක්ෂේත්‍රයෙහි ක්‍රියාකාරීව සිටින තැනැත්තන්ගේ නම් හා ලිපින පිළිබඳ ලේඛනයක් සැකසීම හා පවත්වා ගෙන යාම ;

(ඈ) තම සාමාජිකයන් පිළිපැදිය යුතු චර්යා හා ආචාර ධර්ම සංග්‍රහයක් සකස් කිරීම ;

(ඉ) පත්‍රකලාවේදීන්ට උපදෙස් දීම හා මග පෙන්වීම සහ ඔවුන් වෙනුවෙන් මැදිහත් වී කටයුතු කිරීම ;

(ඊ) රටේ පත්‍ර කලා කටයුතුවල විෂය ප්‍රමාණය පුළුල් කිරීමේ අරමුණ ඇතිව වාරිකව සඟරා හා වෙනත් ලේඛන ප්‍රකාශයට පත් කිරීම ;

(උ) පත්‍ර කලාව පිළිබඳ විභාග පැවැත්වීම සහ පත්‍ර කලාවෙහි නියැලීමට ප්‍රවීනත්වය ලබා ඇතැයි සංස්ථාව සලකන තැනැත්තන්ට සහතික ප්‍රදානය කිරීම ;

(ඌ) පත්‍ර කලාවේ තත්ත්වයන් දියුණු කිරීම පිණිස වෙනත් පිළිගත් ආයතන සමඟ සහයෝගීව ක්‍රියා කිරීම ; සහ

(එ) පත්‍ර කලා ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව සිටින තැනැත්තන්ගේ ශුභ සිද්ධිය හා යහපත පිණිස අවශ්‍ය වෙනත් පියවර ගැනීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යෑමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදාන හා පරිත්‍යාග ලබා ගැනීමේ හෝ එකතු කිරීමේ ද ස්වකීය මුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවකයන් බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ හා සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ල හෝ ඉන් කිසිවක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා එසේ අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා, කරුණු හා දේවල් කිරීමේ, ඵූටු කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

6. (1) සංස්ථාවේ රීතිවලින් විධිවිධාන යොදා ඇති පරිදි වූ ද ඒ අනුව තෝරා ගන්නා ලද්දා වූ ද නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත විධායක කාරක සභාවක් විසින් සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දිනයට ඉහතින්ම වූ දිනයෙහි සංගමයෙහි ධුරය දැරූ විධායක කාරක සභාවේ සාමාජිකයන්ගෙන් සංස්ථාවේ පළමුවන විධායක කාරක සභාව සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

7. (1) සංස්ථාව විසින් පහත සඳහන් කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන්, මහා සභා රැස්වීමක දී, පැමිණ සිට ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතරයකින්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට පටහැනි නොවන රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය :—

(අ) සාමාජිකත්වය පිළිබඳ නියමයන් සහ කොන්දේසි සහ සාමාජිකයන් බඳවාගැනීම ලේඛනගත කිරීම, ඉවත්වීම, අත්හිටුවීම හෝ පහ කිරීම ;

(ආ) විධායක කාරක සභාවට තෝරා ගැනීම සඳහා සුදුසුකම් හා තෝරා ගන්නා ක්‍රමය, එහි සාමාජිකයන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම හෝ ඉවත් කිරීම හා ඔවුන්ගේ චර්යාව, බලතල, කාර්තව්‍ය හා කාර්ය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ චර්යාව, බලතල, කාර්තව්‍ය හා කාර්ය ;

(ඈ) විධායක කාරක සභාවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් කැඳවීම, පැවැත්වීම, පැවැත්වෙන වේලාවල් හා ස්ථාන, ඒවා පිළිබඳ දැන්වීම් හා න්‍යාය පත්‍ර, ඒ සඳහා ගණ පූරණය හා ඒ රැස්වීම්වල කටයුතු කිරීම ;

(ඉ) පත්‍ර කලා ක්ෂේත්‍රයෙහි ක්‍රියාකාරී වන නෑනෑන්තන් ලියාපදිංචි කිරීම ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය කිරීම, එහි අරමුදලේ ආරක්ෂා භාරය, එහි ගිණුම් පැවැත්වීම හා විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පිළිබඳ කළමනාකරණය හා එහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද කවර හෝ රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබිය හැකි ආකාරයෙන් ම සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(3) මේ පනත ආරම්භ වන දිනයට ඉහතින්ම වූ දිනයෙහි බලාත්මකව පවත්නාවූ සංගමයේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතුය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු ණය හා සංගමයට ලැබිය යුතු ණය.

8. මේ පනත ආරම්භවන දිනයට ඉහත්තෙම වූ දිනයෙහි පවත්නා සංගමයේ සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කෙරෙන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, සංගමයට ගෙවිය යුතුව ඇති සියලු ණය, දායක මුදල් හා සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

9. සංස්ථාවේ මුද්‍රාව යටත් පිරිසෙයින් විධායක කාරක සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට නො තැබිය යුතු අතර තව ද, ඔවුන් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයට අත්සන් තැබිය යුතු ය. ඒ අත්සන් කිරීම යම් තැනැත්තකු සාක්ෂිකරුවකු වශයෙන් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. ඒ සාමාජිකයන්ගෙන් එක් අයකු සභාපති හෝ ප්‍රධාන ලේකම් හෝ භාණ්ඩාගාරික විය යුතු ය.

සංස්ථාවට චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

10. යම් මිළදී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍ර නියෝදනයක් මගින් හෝ අන්‍යාකාරයෙන් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමටත්, දැරීම ටත් නීතියෙහිලා සංස්ථාවට හැකියාව හා ශක්‍යතාව ඇත්තේ ය. තවද ඒ සියලු දේපළ සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා සහ තත්කාලයෙහි වලංගුව පවත්නා සංස්ථාවේ රීතිවලට යටත්ව දරනු ලැබිය යුතු ය. ඒවා විකිණීමට, උකස් තැබීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීමට සම්පූර්ණ බලය සංස්ථාවට තිබිය යුතු ය.

ජනරජයේ හා වෙනත් අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතේ ඇතුළත් කිසිවකින්, මේ පනතෙහි සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මගින් හෝ ඔවුන් යටතේ හෝ හිමිකම් පාන්නන් හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.